# නිර්මාණ Nirmana

## ලැබූ නව වසරට......!

දකින අසන තොරතුරු වැදගත් වේවා
සිතන පතන සැම දෙය යහපත් වේවා
තබන තබන අඩි දියුණට පත් වේවා
ලැබූ නව වසර සතහට සෙත් වේවා!

ලොව හැම තැනම සාමය එක ලෙස වේවා
පවතින නපුරුකම් වෛරය නැති වේවා
දවසට දෙකට යහගුණ දම් මතු වේවා
පව යට ගොසින් පින නිතරම නැඟ ඒවා!

මැදහත් බවම සිත්වල නිති පව තීවා
වැදගත් දෙයම කාගෙත් අරමුණු වේවා
ලැබගත් සුව පහසුකම් හැම සුරැ කේවා
සිරිමත් බුදු ගුණය සිත්වල වැජ ඹේවා!

ඇතිවන සැම දෙයම යහපතටම වේවා
උපදින සියළු දෙය රට දියුණට වේවා
නැගඑන උතුම් ගුණ සිත්වල වැඩි වේවා
තෙරුවන් බලය ලැබ ලෝකෙට සෙත් වේවා!

♦ පූජ්‍ය කුරුණෑගොඩ පියතිස්ස හිමි
නිව්යෝර්ක් බෞද්ධ විහාරය
NewYork USA



## දුරුතු පෝය දින නමදිමු කැළණිය!

පොදි බැඳ අළුත් අවුරුද්දේ සිතුම් පැතුම්
බුදු පා පහස ලැබූ පින්බිම වඳිමු උතුම්
මතුවෙයි සිතේ මෙත් කරුණා දැහැමි සිතුම්
ගිලිහෙයි ටිකෙන් ටික සසරේ එතුණු ගෙතුම්

බුදු ගෙයි බෝ මළුව ගංගා නද අතරේ
සීතල දුරුත්තට සිල් සුවඳම පැතිරේ
පින්බර හඳක් පායයි දුර නිල් අඹරේ
බොදු සිත් නිවී සැනසෙයි බුදු ගුණ මිහිරේ

හේවිසි නළා බෙර තාලම් හඬ වමිනා
කැළණියෙ දුරුතු පෙරහැර දන මන පොබනා
බෝපත් සිඹ හමන මඳ පවනේ අමුණා
නා මෙනවියන් වැයූ වීණා හඬ ඇසෙනා

සැනසෙයි වෙහෙර බෝමැඩ ගැටුණු විට නෙතේ
සිහිවෙයි නෙක වැණුම් සංදේශ කවි පොතේ
දුරුවෙයි නිබඳ දුක් සංකා තැවුල් සිතේ
විහිදෙයි දම් සුවඳ ලකඹර සතර අතේ

සිල්වත් සිතින් පෙහෙවස් දම් පුරන් නයි
නැණවත් ලෙසින් බුදුබණ පිළිපදින් නයි
වල්මත් නොවී දැහැමෙන් දිවි ගෙවන් නයි
පින්වත් සැමට සුබ අවුරුදු ලබන් නයි!

♦ පද්මා කුරුප්පු
Paris France

## සරුංගලේ

පිනිකැට නොතකා වැහිපොද අතරින්
අහසට නැගෙනා සරුංගලේ
පාට පාට වලිගය වනමින් උඩ
අප දෙස බලනා සරුංගලේ
නූලේ වැරයෙන් සුළඟේ බලයෙන්
ඉහළට නැග යන සරුංගලේ
ඈත පෙදෙස් දැක ගන්නට යන්නට
පමා නොවනු මැන සරුංගලේ

♦ හේමා විමලසුන්දර
Ilford Essex UK



## නව වසරේ පැතුම් !

දෙදහස් දොළහ නව වසරත් උදාවේ
නව හිරු රැස් කැරළි අහසේ සිනාවේ
සරුවී භවභෝග සම්පත් වගාවේ
අටුකොටු පිරේවා! රට සරු වුණාවේ!

නිමවී ගොසින් කොයි කාගෙත් බඩ ගින්න
වහලක් ලැබ සැමට අතු පැල්වල ඉන්න
ලෙඩ දුක් අවම වී වැඩපළ කර ගන්න
කාටත් ලැබේවා! සැනසිල්ලේ ඉන්න

ගතකළ වසර ආපස්සට හිනා වෙලා
කරගත් මෝඩකම් ආදිය ඉවත හලා
කාලය කා දමන නිකමෙක් වාගෙ වෙලා
ඉන්නේ නැතුව පා ඔසවනු දියුණ බලා

දුක සැප දෙකම කාටත් එක ලෙස පොදුවේ
වැටි වැටි නැගිටින්න හිත මෙහෙවිය යුතුවේ
දෑතේ වීරියෙන් කම්මැලිකම දුරුවේ
සැනසුම සැප දියුණ ළං කරගත යුතුවේ

මිනිසා තිරිසනුන් වන ගති නැති වේවා
දරුකැළ මැණික් කැට මෙන් නිති බැබ ලේවා
එක රොත්තේ මැරෙන වේගය අඩු වේවා
තෙරුවන් සරණ ලැබ ලක්මව සුරැ කේවා!

♦ ප්‍රේමා එස්. රූපසිංහ
නුගේගොඩ Sri Lanka

## රූකඩ නැටුම්

රූකඩ පෙත්ත සරසවයි දිලිසෙන ඇඳුමකින්
පළඳවයි කනකර ආභරණ ඇති තරම්
කියයි ඔහු කනට කර ආලයෙන්
ඔයා දැන් හරි හැඩයි මනමාලියක් වගෙයි
සිතයි ඈ ප්‍රමුදිතව කෝලයෙන්
මම හැඩයි ඒ තරම් හරි අගෙයි හරි අගෙයි.

**පසුව ඔහු**

ඇඟිලිතුඩු අතර ඇති නූල එහෙ මෙහෙ අදියි
උඩ පනියි බිම පනියි කරකැවෙයි ඈය නටයි
නැගෙන ඔල්වර හඬට තව තවත් ඈය නටයි
දෙපාවල හම ගිහිං මුළු ඇඟම කෙඩෙත්තුයි
එහෙත් නැත අස්වැසුම් නූල එහෙ මෙහෙ දුවයි

**කලකට පසු**

දුබල වී දෙඅත් පා ගෙයි මුල්ලෙ සිටියි ඈ
දැන් නොමැත ඒ හැඩය
දැන් නොහැක ඒ නැටුම්
මකුළු දැල් මැත්කර දුබල නෙත් අරින විට
දූලි රොද මැද සිටන් සම්මාන දෙස බලා
ඇඟිල්ලෙන් පිරිමදින ඔහු පෙනෙයි යන්තමට



♦ ප්‍රදීපා වික්‍රමසිංහ
London SW19

## වසන්තයේ මල් මියගිය රාත්‍රිය

පෙති විහිදා විකසිත වී
මදනල හා සුවඳ විදා
මුසපත්කර බඹරුන්
වසන්තයට සිරි ගෙන දුන්

ඒ මල් සැම මියැදුණි

නුහුරු සීත සෘතුවක්
ඇරඹුණු පෙර රාත්‍රියේ
පිනි වෙනුවට පෙති මත
රුදුරු හිම බිඳු පතිතව

♦ සුනිල් පෙරේරා
Skegness Lincs

## දිසාපති කාමරයේදී

එක යුගයක ජීවිතයේ සරතැස නිවූ මා සුමිතුර
දුර හිඳිනා ඔබ දකින්න ආවෙමි දිගු කලකට පසු
බමන විදුලි පංකාවෙන් වා ගැබ කළඹන හඬ මිස
එසඳ ඔබේ මුවග නැගුණු සාද තෙපුල් නැසේ මට
මේසය මත ලිපිගොනු රැස සුළඟෙ නොයා දී රකිමින
ඒ මත හිඳිනා ගලසේ මා අබියස නිහඬය ඔබ
බිත්තියෙ ඇති සේයා රූ එකිනෙක එබී එබී බලයි
නැතියෙන් ඔබෙ වත හසරැළි මදෙස බලා සිනා සලයි
බාලේ අපි ගම්දොර කෙළිමඩුළු මැදින් ආ ගමනේ
මහදේ ඇදි ඔබෙ සිතුවම
කොහි සැඟවුනිදැයි නොදැනේ
එක යුගයක ජීවිතයේ සරතැස නිවූ මා සුමිතුර
ඔබ අසලින් බැහැරට යමි කුමටද ඔබගේ අවසර ?

අභාවප්‍රාප්ත කිවිඳිය
♦ මොනිකා රුවන්පතිරණ

## නික්මයාම

නුඹ ඇවිත් ගියා මෙවර
පෙර පැමිණි අය සේම නොඉඳ
ඉතින් කිම දුක්වෙන්ට කරුණ
මම අහිමි අයත් ඇති මෙහෙම

හඬන්නට කරුණු වැඩි ලොවක
මුදන්නද කඳුළු නුඹ ගැනම
හිසින් ගෙන සුබ අසුබ සිහින
යන්ට කල් දැන් අපිට වෙනම

අප හමුවෙන්ට ගිය අයුර
අපට මිස ලොවට මොන අරුම
හමුවුනත් පෙරුම්පිරු ලෙසම
අතෘප්තිය ගැලක් සේ සරන

වෙන්ව ගිය අය මිසක් සසර
හමුවුනත් කිකලකටද සොඳුර
නුඹත් එක නිමිත්තක් පමණ
සිහින බිඳ දිවිය සිහිකරණ

♦ රවී සිරිවර්ධන
පිලියන්දල Sri Lanka

## සිරකළ සිතක් !


කරදර නිමාකොට හිරු බැස ගිය විටෙක
කලුවර සිනාසී තනි රැක්කා රැයක
මහමෙර තරම් උස දොම්නස් විමා නෙක
සිරකර තැබූ සිත දැන් බර කතා වක

පඩුඩවන් ලියූ දේ වනපොත් කළ ද තදින්
දැනුමෙන් පලක් වූයේ නෑ සිතු ලෙදින්
සිතුවම් ඇන්ද මුත් බොඳවී මැකී ගිහින්
ගැයුමන් ගයන්නේ තනුවට බොහොම දුරින්

තර්ජන මේ ගැජුම් සවනට නොගන් නෙමි
දුර්ජන දුසිල් පත් පෙළපොත් පුලුස් සමි
වර්ජන ඇතද මධු මී රස පතන් නෙමි
රංජන කනක මිණි මත පය තබන් නෙමි

තරණය කළද දිගු දුර එතැනම ඉන්නේ
සරණය පතා යැදි දෙවොලට යට වන්නේ
වරණය වාරණය එකිනෙක පැට ලෙන්නේ
මරණය නිසයි ජීවත්වන බව දන්නේ

♦ රාජේන්ද්‍ර ජයසුන්දර බණ්ඩාර
ගම්පහ Sri Lanka



පූජ්‍ය ගංගොඩවිල සෝම ස්වාමීන් වහන්සේ අපවත්වී අවුරුදු 7 ක් සම්පූර්ණ විය. මේ කවි පෙළ උන්වහන්සේගෙන් සිදුවූ සේවය අගැයීමක් මෙන්ම ඒහිමියන් ගැන කාගේත් මතකය අවදි-කිරීමක් ද වශයෙනි.
ගෞරවනීය අප සෝම හිමියන්ට උතුම් නිවන් සුව පතමු !

## යළි ඒ වදන් කවදා අසමුද ?

ලක්දිව ගිලගනී මිසදිටු මරු කතර
සදහම් ගඟුල වියැකීයයි ඒ අතර
තම සුව හැර සොබා එඩි පා දෙමිනි උර
මතුවූ දිය ඌල කවුරුද මෙ ඔබ හැර

පස් පව්කමෙන් වැළකී හොඳ නරක දැන
පන්සිල් රකින රට දැය බිහිකරන මෙන
දන්නෙමු බුදුපුතුනි ඔබ ගත් වෙහෙස ගැන
ඒ බුදු මගේ යන්නට නැත අපට පින

බුදු බණ නසන මිසදිටු අදහස් පරදා
නැණ පහනින් එළිය කළ බොදු සිත් සැමදා
පැණසර ඔබෙ වදන් යළි අසමුද කවදා
කොහි වැඩියේද හිමි අප අසරණ කරදා

සුවහස් ගණන් තරුකැට දිලුනත් අඹර
එළියක් කොහිද එක සඳ මඬලින් විතර
ගිගිරුම් නගින සුළඟට නොසැලුණු සුනෙර
පුදසුන් කරමි හදගැබ හිමියනි පවර !

♦ නිරූපා රූද්‍රිගු Sri Lanka

## හැංගිමුත්තන්

කෝ මගේ පුංචි දූ
කොහෙද අද හැංගුණේ
දන්නවා මං හොරේ
කවුද ඔය කාමරේ

මවුනි! අද ඔබ නැතත්
ඔබෙ සුවඳ මා ළඟයි
පොඩි හැංගිමුත්තමක්
කරන්නට මට හිතෙයි

ඔබේ රුව හැංගිලා
මගේ පපු කුහරයේ
සොයමි අහුමුළු නැර
අද මගේ වාරේ

එදා වගෙ මම තාම
ඔබෙ පුංචි දෝණිමයි
ඔබෙ සුවඳ මට තාම
කපුරු මල් සුවඳයි !



♦ ශ්‍රියා කුමාරසිංහ
Dunedin
New Zealand

## Sinhala Poetry හෙළ කවි

### from Salalihini Sandeshaya of Ven. Thotagamuve Sri Rahula Thera

### සැළලිහිණි සංදේශයෙන්

මිතුරුතු මෝ දුක් සැප දෙකෙහි ම පැවැතී
බිතුසිතු වම් රූ මෙන් පිටු නොපා විතී
යුතුමතු වැඩ ම තෙපල එවැනි ගුණ ඇතී
සිතුනතු කර අස යහලුව වඩන රුතී

දුක සැප දෙකෙහි ම එක ලෙස සිටිනා මිතුරන් බිත්තියෙහි ඇන්දා වූ චිත්‍රරූප මෙන් අපට කිසි විටෙක පිටුපාන්නේ නැත. එවැනි ගුණයෙන් යුක්ත වූත්, සිතෙහි සතුට වඩවන්නාවූත් මගේ සුමිතුර, මතු යහපත සාදන, මා මේ කියන්නා වූ දේ හොඳින් අසන්න!

Mithruthu mo duk sepa dekehima peva thi
Bithusithu vam ru men pitu nopavi thi
Uthumathu veda ma thepala evani guna ethi
Sithunathu kara asa yahaluwa vadana ru thi

My noblest friend, you stay with us both in adversity and prosperity, like the mural painting that never turns its back. Hear deligently my words that will bring thee future prosperity.